ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

## පුරප්පාඩු

**ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ පවතින කතරගම වැඩිහිටි නිවාසයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

| තනතුරු නාමය | ස්ථානභාර නිලධාරී - තනතුරු 01 |
| --- | --- |
| පත්වීමේ ස්වභාවය | ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා ගිම්කම් සහිත |
| මාසික වැටුප | (2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)<br>JM 1-1 2025- රු. (72,650-10X1360-18X2040-122,970) |
| වයස් සීමාව | අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ. |
| සුදුසුකම් | **බාහිර අයදුම්කරුවන්**<br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ විද්‍යා, වාණිජ, ව්‍යාපාර කළමනාකරණය, හෝ කලා උපාධියක් ලබා තිබීම.<br>**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**<br>1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අංක 1 හි දක්වා ඇති සුදුසුකම් සපුරා තිබීම.<br>2. වැඩිහිටි ගිම්කම් ප්‍රවර්ධන නිලධාරී (MA3) තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම. |

| තනතුරු නාමය | සාත්තු සේවිකා - තනතුරු 02 |
| --- | --- |
| පත්වීමේ ස්වභාවය | කොන්ත්‍රාත් පදනම, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා ගිම්කම් සහිත |
| මාසික වැටුප | (2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව) රු. 40,403 + ජීවන වියදම් දීමනාව |
| වයස් සීමාව | අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. |
| සුදුසුකම් | **සුදුසුකම් (අනිවාර්ය පොදු සුදුසුකම්)**<br>**අධ්‍යාපන**<br>(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී<br>i. සිංහල /දෙමළ ii. ගණිතය iii. ඉංග්‍රීසි භාෂාව<br>යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.<br>(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.<br>**(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසකම් :-**<br>සාත්තු සේවය සම්බන්ධයෙන් තෘතීය හෝ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා මාස 03 කට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම. **හෝ**<br>ප්‍රථමාධාර ලබාදීම සම්බන්ධයෙන් තෘතීය හෝ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා මාස 03 කට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම. |

| තනතුරු නාමය | රියදුරු - තනතුරු 01 |
| --- | --- |
| පත්වීමේ ස්වභාවය | කොන්ත්‍රාත් පදනම, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා ගිම්කම් සහිත |
| මාසික වැටුප | (2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව) රු. 38,387 + ජීවන වියදම් දීමනාව |
| වයස් සීමාව | අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. |
| සුදුසුකම් | **සුදුසුකම්**<br>**5.1.1 අධ්‍යාපන සුදුසුකම්**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයන් හය (06) කින් සමත් වීම.<br>**5.1.2 ප්‍රවීණතා**<br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද ලබා තිබීම. |

| තනතුරු නාමය | අරක්කැමි - තනතුරු 01 |
| --- | --- |
| පත්වීමේ ස්වභාවය | කොන්ත්‍රාත් පදනම, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා ගිම්කම් සහිත |
| මාසික වැටුප | (2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව) රු. 37,715 + ජීවන වියදම් දීමනාව |
| වයස් සීමාව | අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. |
| සුදුසුකම් | **සුදුසුකම්**<br>සූප ශාස්ත්‍රය / ආහාර තාක්ෂණය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. |

| තනතුරු නාමය | අරක්කැමි සහායක - තනතුරු 01 |
| --- | --- |
| පත්වීමේ ස්වභාවය | කොන්ත්‍රාත් පදනම, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා ගිම්කම් සහිත |
| මාසික වැටුප | (2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව) රු. 36,475 + ජීවන වියදම් දීමනාව |
| වයස් සීමාව | අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. |
| සුදුසුකම් | **සුදුසුකම්** : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම.<br>**වෘත්තීය සුදුසුකම්** : සූපවේදය පිළිබඳ මාස 03 ට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම. |

| තනතුරු නාමය | උපස්ථායක / උපස්ථායිකා - තනතුරු 04 |
| --- | --- |
| පත්වීමේ ස්වභාවය | කොන්ත්‍රාත් පදනම, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා ගිම්කම් සහිත |
| මාසික වැටුප | (2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව) රු. 36,475+ ජීවන වියදම් දීමනාව |
| වයස් සීමාව | අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. |
| සුදුසුකම් | **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම සමග මාස 06 කට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ (උපස්ථායක කටයුතු වලට අදාළව) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |

| තනතුරු නාමය | කාර්යාල සහායක - තනතුරු 02 |
| --- | --- |
| පත්වීමේ ස්වභාවය | කොන්ත්‍රාත් පදනම, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා ගිම්කම් සහිත |
| මාසික වැටුප | (2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව) රු. 36,475+ ජීවන වියදම් දීමනාව |
| වයස් සීමාව | අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. |
| සුදුසුකම් | **සුදුසුකම්** : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම. |

| තනතුරු නාමය | බංගලා භාරකරු - තනතුරු 01 |
| --- | --- |
| පත්වීමේ ස්වභාවය | කොන්ත්‍රාත් පදනම, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා ගිම්කම් සහිත |
| මාසික වැටුප | (2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව) රු. 36,475+ ජීවන වියදම් දීමනාව |
| වයස් සීමාව | අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. |
| සුදුසුකම් | **සුදුසුකම්** : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම සමග ආහාර සැකසීම පිළිබඳ මාස 06 ට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම. |

| තනතුරු නාමය | බහු කාර්ය තාක්ෂණ සහායක - තනතුරු 01 |
| --- | --- |
| පත්වීමේ ස්වභාවය | කොන්ත්‍රාත් පදනම, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා ගිම්කම් සහිත |
| මාසික වැටුප | (2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව) රු. 40,008+ ජීවන වියදම් දීමනාව |
| වයස් සීමාව | අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. |
| සුදුසුකම් | **සුදුසුකම්**<br>විදුලි හා ජල පරිපථ පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. |

### සේවා නියුක්ත කරවීමේ කොන්දේසි

- ස්ථානභාර නිලධාරී හා කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරට අදාළ පත්කිරීම් ස්ථිර වන අතර, සාත්තු සේවිකා, රියදුරු, අරක්කැමි, අරක්කැමි සහායක, උපස්ථායක, කාර්යාල සහායක හා සංචාරක බංගලා භාරකරු යන තනතුරු සඳහා පත්කිරීම් කොන්ත්‍රාත් පදනම මත වන අතර, වසර දෙකක කොන්ත්‍රාත් කාලයකට යටත් වේ. තනතුරෙහි අවශ්‍යතාවය හා සතුටුදායක කාර්ය සාධනය මත වාර්ෂික කොන්ත්‍රාත් පදනම මත සේවය දීර්ඝ කිරීමේ හැකියාව ඇත.
- රජයේ අනුමත ප්‍රතිපත්ති අනුව සේවක අර්ථසාධක අරමුදලට හා සේවා දායකයින්ගේ භාරකාර අරමුදල සඳහා ගිම්කම් සහිත වේ.
- 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ සහ 2011 අංක 05 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධිත) පනතේ විධි විධාන වලටත්, රජය විසින් වරින් වර පනවනු ලබන නීති රීති රෙගුලාසි වලටත් යටත් විය යුතුය.
- මෙම බඳවාගැනීම් සිදුකරනුයේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ පවතින කතරගම වැඩිහිටි නිවාසය සඳහා පමණි.

### වෙනත් පොදු කරුණු

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

- ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.
- තනතුරකට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

### තනතුරු සඳහා බඳවාගැනීමේ ක්‍රමය

ප්‍රසිද්ධ දැන්වීම් හෝ පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවීමෙන් පසුව පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරාගැනීමෙන් පසු බඳවාගනු ලැබේ. අරක්කැමි, අරක්කැමි සහායක හා රියදුරු තනතුරු සඳහා වෘත්තීය පරීක්ෂණයක් ද පවත්වනු ලැබේ.

I. මෙම සේවා ගණයට සිදුකරනු ලබන සියලුම පත්කිරීම් / බඳවාගැනීම් මෙන්ම සේවා ගණය තුළ උසස් කිරීම් මෙම පටිපාටියෙහි විධිවිධානයනට තරයේ අනුකූල වන පරිදි පමණක් සිදු කළ යුතුය.

I. බඳවාගැනීමෙන් පසු සේවයේ යෙදවීම හා ඊට අනුෂාංගික අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ආයතනික කාර්ය පටිපාටි සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

I. මෙම බඳවාගැනීම් පටිපාටියේ සඳහන් සියලු කරුණු සම්බන්ධයෙන් මෙහි දැක්වෙන විධිවිධාන ආයතනික කාර්ය පටිපාටි සංග්‍රහයේ විධිවිධාන අභිබවා ක්‍රියාත්මක විය යුතුය.

### අයදුම්පත් යොමු කිරීම

අයදුම්පත් ආයතනයේ නිල වෙබ් අඩවියට (nse.gov.lk) පිවිසීමෙන් ලබාගත හැකිය.

ජාතික හැඳුනුම්පත, සියලුම අධ්‍යාපන සහතික, වෙනත් සුදුසුකම් සනාථ කරන සහතික වල ඡායා පිටපත් අයදුම්පත්‍රය සමග අමුණා **2026.03.10** වැනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි අධ්‍යක්ෂ, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය, දෙවන මහල, ඩී කොටස, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ඔබ ඉල්ලුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණය සඳහා ජාතික හැඳුනුම්පත සහ ඉහත ඡායා පිටපත් මගින් ඉදිරිපත් කරන ලද සහතිකයන්හි මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි.

තනතුරු කිහිපයකට අයදුම්කරන අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුයි.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය.

අයදුම්පත් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ සතුය. එසේම, ඉහත තනතුරු සියල්ලම හෝ ඉන් එකක් හෝ එකකට වැඩි ප්‍රමාණයක් බඳවාගැනීමේ හෝ නොගැනීමේ තීරණය වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සතුය.

සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, අදාළ සහතික වල ඡායා පිටපත් අමුණා නොමැති හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලෙන් අස්ථානගත වන අයදුම්පත් පිළිබඳ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වගකියනු නොලැබේ.

**අධ්‍යක්ෂ,**
**ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය**
**දෙවන මහල, ඩී කොටස, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල**
**2026.02.24**